**නාගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 29 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක සහ අමතර කොටස් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.431,520 ක් පරිගණක හා උපාංග යටතේ ගිණුම්ගත නොකර යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු දායක මුදල් රු.2,309,604 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම් වටිනාකම රු.46,149 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා පුස්තකාල පොත් ශේෂය රු.46,149 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලද WPLL – 7103 දරන ටිපර් රථය හා WPRD – 9457 දරන ට්‍රැක්ටරයේ වටිනාකම් ගණනය කර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) වැය ලේඛනයේ ප්‍රාග්ධන වැය යටතේ දක්වා ඇති රු.129,985 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා උසාවි දඩ රු.44,015 ක් වැඩියෙන් බිල් කිරීම නිසා රු.44,015 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්විණි.

(උ) ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.1,524,200 ක් අඩුවෙන් බිල් කිරීම නිසා සමාලෝචිත වර්ෂය ආරම්භයේ මූල්‍ය ප්‍රකාශනවල ශේෂය රු.1,524,200 ක් අඩුවෙන් දැක්විණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

(අ) ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.6,725,498 ක වෙනසක් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 03 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපලේඛන අනුව ශේෂයන් අතර රු.196,804 ක වෙනසක් පැවතුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

අවිනිශ්චිත ගිණුමේ රු.18,314 ක් වූ බැර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.90,067,544 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, යාවත්කාලීන කරන ලද ණයගැති ලේඛනය, උපලේඛන සහ කාල විශ්ලේෂණය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු.676,866 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු.3,630,007 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 අක්කර බදු**

අක්කර බදු ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.242,859 ක් වූ අතර, එකී හිඟ ශේෂය අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදු කුලී**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගත යුතුව තිබූ රු.292,208 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 කඩ කාමර බදු**

----------------

(i) පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක: දපපා/පපාකො/2010/01 හි දරන චක්‍රලේඛයේ ඡේද අංක 05 මගින් දක්වා ඇති පරිදි සෑම බදු ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කලයුතු වුවත්, මාපලගම දෙමහල් වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල බිම් මහලේ කඩ කාමර 03 ක් සහ උඩු මහලේ කඩ කාමර 04 ක් බදු ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. තල්ගස්වල පොදු වෙළඳපොල 1985 වර්ෂයේදි බදු දී තිබූ කඩ කාමර 04 ක සහ 2007 වර්ෂයේදි දී බදු දී තිබුණු කඩ කාමරයක විගණන දිනය වූ 2015 මාර්තු 30 දින වනවිටත් ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ii) ගිවිසුමේ අංක 03 කොන්දේසි ප්‍රකාරව මාසික කුලිය ඒ ඒ මාසයේ 10 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත් මාපලගම දෙමහල් වෙළඳ සංකීර්ණයෙන් අයවිය යුතු රු.134,900 ක හිඟ මුදල් 2015 මාර්තු 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, තල්ගස්වල පොදු වෙළඳපොල කඩ කාමර 03 කින් රු.40,500 ක් වූ මාස 09 ක බදුකුලී හිඟව පැවතුණි. තවද, මාපලගම මංසන්ධියේ පැරණි කඩ කාමර 04 කින් 2014 දෙසැම්බර් 31 දිනට රු44,850 ක් කුලී හිඟව පැවතුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 494,931 ක උසාවි දඩ හා රු. 331,542 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

**(අ) වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම**

-----------------------------------------------

1988 අංක 74 දරන (සංශෝධිත) පනතින් 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2014 වර්ෂයේ දී සභාපති, උප සභාපති ඇතුළු සභිකයින් 05 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ප්‍රතිපාදන මුදල් ලබා නොගෙන වියදම් දැරීම**

-------------------------------------------------

2013 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රොටරි වර්ගයේ හලන යන්ත්‍රයක් මිලදී ගැනීමට රු.300,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, 2014 ජූනි 27 දින රු.280,000 ක් සභා අරමුදල් වැයකර රොටරි වර්ගයේ හලන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. එසේ වුවද විගණන දිනය වූ 2015 මාර්තු 30 දින වන විටත් එකී රු.280,000 ක මුදල සභාව වෙත ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

### 3.2 උත්සව වියදම්

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුතු කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් යම් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක්දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු වුවද, එලෙස විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන 2014 වර්ෂය තුළදී රු.70,438 ක උත්සව වියදම් සභාව විසින් දරා තිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

2013 ජුනි 05 දිනැති අංක : PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස දන්වා තිබුණ ද බැකෝලෝඩර් යන්ත්‍රයක්, ට්‍රේලරයක් සහ අත් ට්‍රැක්ටරයක් විගණන දිනය වූ 2015 මාර්තු 26 දින වනවිටත් ඒ අනුව කටයුතු නොකර, නිෂ්ක්‍රීයව සභා උප කාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

### 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

සභාව සතු වාහන සඳහා ඉන්ධන අවශ්‍යතා හඳුනාගෙන ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු නොකර, සභාපතිවරයා විසින් 2014 වර්ෂය තුළදී ඉන්ධන ලීටර් 8,238.25 ක් අත්පිට මුදලට ලබාගෙන බිල්පත් ඉදිරිපත් කර රු.1,024,529 ක් සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

සභාව සතු වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් ද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

----------------------

සභා බලප්‍රදේශය තුල ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ලැබී තිබූ රු.105,000 ක් අදාල ව්‍යාපෘති සඳහා භාවිතා නොකර, විගණන දිනය වූ 2015 මාර්තු 29 දින වනවිටත් කර්මාන්ත ගිණුමෙහි නිෂ්ක්‍රීයව රඳවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### අයවැය පාලනය

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය